# 15

# අමතක නොවන දවස

කුමාරත් මමත් කුඩා කල සිට ම මිතුරෝ වූයෙමු. පාසලේ දී මෙන් ම ක්‍රීඩාපිටියේ ද අප සිටියේ එකට ය. ඒ නිසා සියලු දෙනා අප අඹ යහළුවන් ලෙස හැඳින්වූහ. පාසලේ දෙවැනි වාර නිවාඩුව ලබා දුන් දවසේ කුමාර මට කදිම යෝජනාවක් කළේ ය.



"නිමල් අපේ තාත්තා හෙට ගෙදර එනවා. ජීප් එකෙන් එන්නේ. අපි දෙන්නත් තාත්තා එක්ක විනෝද ගමනක් යමු ද?"

ඒ අදහසට මම එකඟවීමි.

කුමාරගේ තාත්තා වනජීවී සංරක්ෂණ නිලධාරියෙකි. ඔහු රාජකාරි කරන්නේ දඹුල්ලේ ය. මාසයකට වතාවක් ගෙදර එන ඔහු අපට නොයෙක් රසවත් කතා කියා දී තිබේ. විශේෂයෙන් අලි, ඇතුන් සම්බන්ධයෙන් ඔහු කී කතා නිසා එහි යාමේ ආශාවක් අපේ සිත් තුළ ද මෝදු වී තිබිණි. මෙවැනි ගමනක් යාම සඳහා අවසර ලබා ගැනීම තරමක් අසීරු කාර්යයක් වුව ද අම්මාටත් තාත්තාටත් කරුණු පහදා දී අවසර ලබා ගතිමි.

කුමාරගේ පියා ගුණවර්ධන නම් වෙයි. අපි ගුණවර්ධන මාමාගේ ජීප් රියෙන් සවස දඹුල්ල බලා පිටත් වුණෙමු. අඳුර ළඟා වෙද්දී අපි ගුණවර්ධන මාමාගේ නිල නිවස වෙත පැමිණියෙමු. ගුණවර්ධන මාමාගේ


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

නිල නිවස පිහිටා තිබුණේ දකුම්කලු පරිසරයක ය. රාත්‍රිය එළඹෙත් ම පැතිරී ගිය නොයෙක් නිශාචර සතුන්ගේ හඬ අප සිත් තුළ බියක් ජනිත කළේ ය. මඳ වේලාවකට පසු රාත්‍රි ආහාරය ගෙන නින්දට ගියෙමු. නමුත් පසු දා ගමන ගැන සිහිවන විට නින්ද අසලකටවත් නොපැමිණියේ ය.

පසු දින උදෑසනින් අපි අවදි වුණෙමු. ගුණවර්ධන මාමාගේ උදවුකරු වූ පාල අයියා සාද දුන් තේ පානය කළෙමු. ඉන් පසු මුහුණ කට සෝදා ගත් අපි පාල අයියා විසින් සකස් කර තිබූ උදේ ආහාරය ද ගෙන ගමනට පිටත් වීමු. දඹුලු මහ වනය මැද ඇති කුඩා වැවක් බඳු දිය පිරුණු පොකුණට එන අලි රංචුවක් කරන, කියන දේ බලා ගැනීමේ ආශාව අප සිත් තුළ තදින් ම කාවැදී තිබිණි. අපි ගුණවර්ධන මාමාගේ නිල නිවසේ සිට සැතපුම් භාගයක් පමණ ඈතට ජීප් රියෙන් ගියෙමු. ගුණවර්ධන මාමා විසින් අපේ ආරක්ෂාවට ලබා දුන් ගාමිණී අයියාත් සමඟ අපි කැලෑව ඇතුළට ගියෙමු. ගාමිණී අයියා අත තුවක්කුවක් ද විය.

වනයේ දී පිළිපැදිය යුතු වත් පිළිවෙත් පිළිබඳ ව ගාමිණී අයියා අපට කියා දුන්නේ ය. හූ කීම, සිංදු කීම, කිසි ම හේතුවක් නිසා කණ්ඩායමෙන් ඈත් වීම නොකළ යුතු බව ඔහු අපට කියා දුන්නේ ය. අප යන ඉසව්වේ දරුණු, රුදුරු වන සතුන් නොමැති බවත්, කවදාවත් දිය නොසිඳෙන මේ පොකුණට නිරතුරු ව ම අලි රැනක් එන බවත් ගාමිණී අයියා පැවසුවේ ය. අපි නිහඬ ව කුඩා අඩි පාර දිගේ කැලෑව ඇතුළට ගියෙමු. පලතුරු සොයා ඇදෙන ගිරා, මලිති, බට්ටි ආදි කුරුල්ලන්ගේ නාදය ඉතා මිහිරි ය. ගඟක අත්තක් සේ සිතිය හැකි කුඩා ගඟක් වනාන්තරය ඈත මායිමේ දිස්වේ. මාදං ගස්වලින් එම ඉවුර වැසී තිබුණි. ඉදුණු මාදං ගෙඩි කෑමට බට්ටිච්චන් සැරිසරන ආකාරය දුටු මගේ කටට කෙළ ඉනුවේ ය.

ඈත වන පෙතේ ගස් මලින් බර වී ඇත. මල්වල සුවඳ දසත පැතිරී යයි. ගසින් ගසට පනින රිළවුන් මට ඔච්චම් කරන්නාක් මෙනි. මල්වල සුවඳ උරාබොන සමනළයන් රැන් රැන් පියඹා යන අයුරු දුටුවෙමි. වැඩි වේලාවක් ගත වන්නට මත්තෙන් අලි ඇතුන් පොකුණ අසල සෙල්ලම්

කරන හඬ ඇසෙන බවත්, නිහඬ ව එන ලෙසත් ගාමිණි අයියා කීවේ ය. ඒ අතර ඔහු ඇස් අයාගෙන යමක් දෙස බලා සිටින බවක් පෙනී ගියේ ය.

"යමු කමක් නැහැ" කියූ ඔහු යළිත් ගමන ආරම්භ කළේ ය. අපි ඔහු අනුගමනය කළෙමු. වැඩි දුරක් යා නොහැකි විය. යෝධ වලසුන් දෙදෙනෙකු එකා පිටුපස එකා අප දෙසට එනු පෙනුණි. අපට කරකියා ගත හැකි දෙයක් නොවී ය. උන්ගෙන් මඟ හැර යාමට ගහකට මුවා වෙන්න යැයි ඔහු අපට කීවේ ය. තුවක්කුව පාවිච්චි කළොත් අලි රළ කුලප්පු විය හැකි ය. ඔහුට උභතෝකෝටික ප්‍රශ්නයකට මුහුණ පෑමට සිදු විය. හිටි හැටියේ ම වනය දෙබෑ කරගෙන විශාල ශබ්දයක් ඇසුණි. බියට පත් මම හනිකට දුව ගොස් ගසකට අමාරුවෙන් නැඟ ගතිමි. ගසට නැඟ බිම බැලූ මට ගස මුල වලසෙක් උඩ බලාගෙන සිටිනු දක්නට ලැබුණි. මම තව තවත් උඩට නැංගෙමි.  කුමාරත් ගාමිණි අයියාත් කොහේ සිටී ද යි මට නිනව්වක් නොවී ය. වනයේ සිරිත් රැකිය යුතු නිසා කළ යුතු වෙනත් දෙයක් ද නොවී ය. ගස මුල සිටි වලසා එතනට පැමිණි තවත් වලසෙකු සමඟ සෙල්ලම් කරනු මම බලා සිටියෙමි. ටික වේලාවකින් "සරාස්" හඬින් ශබ්දයක් ආ නිසා මම ඈත වනය දෙස බැලීමි. ඈතින් එන අලි රංචුවකි. කුඩා අලි පැටවු ද ඔවුන් අතර වූහ. "කොරේ පිටට මරේ "යි මට කියවුණි. මම මහත් භීතියට පත් වුණෙමි. උගුර කට වියළී ඇත. දෙකන්සෙන් දහඩිය වැගිරෙයි. මේ රුදුරු සතුන් නිසා මට ගසෙන් බැසීමට නො හැකි ය.  වනයේ සිරිත් රැකිය යුතු නිසා  කුමක් හෝ කරන්නට ඉඩක් නැති ය.  නිහඬ ව ගසේ මහ කඳට හේත්තු වී දෙබලේ සිටීම හැර වෙනත් විකල්පයක් ද නැත.

හදිසියේ ම ජීප් රියේ නළා හඬ ඇසිණි. ඈතින් කුමාරගේ හඬ ඇසුණේ ය. මගේ ඇඟට අමුතු  පණක්  ලැබුණාක් මෙන් විය. වනයේ සිරිත් බිඳ දමා හැකි වේගයෙන් "හූ" කීවෙමි. කුමාරත්, ගාමිණි අයියාත් මා සිටි ගස දෙසට එනු පෙනිණි. මම දනිපනි ගා ගසෙන් බැස ඔවුන්ට එක් වීමි.

## ක්‍රියාකාරකම්

01). මෙම පාඩම ශබ්ද නගා කියවන්න.

02). පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i මෙහි සඳහන් "අඹ යාළුවෝ" කවුරුන් ද?

ii කුමාරගේ පියාගේ නම කුමක් ද?

iii කුමාරගේ පියාගේ රැකියාව කුමක් ද?

iv ඔවුහු සතුන් බැලීමට කොහි ගියෝ ද?

v වනයේ දී පිළිපැදිය යුතු වත් පිළිවෙත් මොනවා ද?

03). මෙහි සඳහන් නිමල් ඔබ යැයි සිතා මෙම සිදුවීම ඔබේ වචනයෙන් මිතුරාට පවසන්න.

04). ඔබ මුහුණ දුන් මෙවැනි අත්දැකීමක් පන්තිය ඉදිරියේ විස්තර කරන්න.

05). එම සිද්ධිය ඔබේ අභ්‍යාස පොතේ ලිඛිත භාෂාවෙන් ලියන්න.

**පැවරුම්**

01). පහත සඳහන් රචනා ආරම්භයන් කියවන්න.

## සඳ පෑයු රැයක්

එදින පුර පසළොස්වක පොහෝ දිනයකි. දිවා කාලයේ දී මෙන් ගෙමිදුල ආලෝකවත් ව පැවතුණි. මම මිදුලට බැස්සෙමි. මිදුලේ කඩුපුල් මලක් සාඩම්බර ලෙස සිනාසුණි. මගේ මුළු ශරීරය ම සඳ රැසින් නැහැවී ගියේ ය. සඳ එළියෙන් බාධා නොපැමිණි බව කියන්නාක් මෙන් වවුලෝ පියාඹා ගියහ. රෑ පිපෙන මල්වල සුවඳ මා නැහැයට අපූරු වින්දනයක් ගෙන දුනි.

## අසිරිමත් මුහුදු වෙරළ

සුන්දරත්වයෙන් පිරුණු ස්ථාන මා කොතෙකුත් දැක ඇත. මා වඩාත් ම සිත් ගත් තැන මුහුදු වෙරළයි. රළගෙඩි පෙරළි පෙරළී අවුත් සුදෝ සුදු වෙරළ සිපගන්නා අයුරු අතිශයින් රමණීයයි. සිඟිත්තන් වෙරළ සිසාරා දුව පනිමින් කෙළි දෙළෙන් පසු වන අයුරු දකින කා තුළත් සතුටක්, සැනසීමක්, සුවයක් ඇති වේ. ආපසු හැරී යන සුදෝ සුදු දිය රළ ඈතට ගිය පසු කිරිකවඩි හා සිප්පි කටු ඉතිරි වේ. පොඩිත්තෝ සිනා සිසී සිප්පි කටු එකතු කරමින් සිය දෑත් පුරවා ගනිති.

## වැඩිහිටියන්ට ගරුකරමු

කුඩා ළමයින් වන අපට ලෝකය හඳුනාගැනීමට මග පෙන්වන්නෝ වැඩිහිටියෝ ය. අපගේ දෙමව්පියෝ කුඩා කල සිට ම අප කවා පොවා ඇති දැඩි කරති. හොඳ නරක කියා දෙති. අප වැඩිහිටියන් වී සමාජයට එක්වන තුරු ම අපට නොයෙක් ආකාරයෙන් උදවු උපකාර කරති. එසේ ම ගුරුවරු ද අපට මඟ පෙන්වන, සිප් සතර ලබා දෙන උතුම් පිරිසකි. අපගේ ඉදිරි ගමන සාර්ථක කර ගැනීමටත්, යහපත් පුරවැසියන් ලෙස ජීවත්වීමටත් අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලබාදෙති. අපගේ අනෙකුත් වැඩිහිටියෝ අපේ ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා ආශීර්වාද කරති. යහගුණ ඇති ව ජීවත් වීමට අවශ්‍ය අවවාද අනුශාසනා ලබා දෙති. අපට උදව් උපකාර අවශ්‍ය වූ විට ඒ සඳහා ඉදිරිපත් වෙති. මේ නිසා වැඩිහිටියන්ට ගරු කිරීම, ඒ අයගේ අවවාද පිළිගැනීම, ආශීර්වාද ලබා ගැනීම අපගේ යුතුකමකි.

02). පහත සඳහන් මාතෘකාවලට ආරම්භක ඡේද ලියන්න.

i සැඳෑ අසිරිය
ii දිය ඇල්ලක් අසල දී
iii මා දුටු පෙරහැරක්
iv මම සමනලයෙක්මි
v මගේ මවුබිම/ සුන්දර ශ්‍රී ලංකා

03). පහත සඳහන් රචනා සැකිලි උපයෝගි කරගෙන ඔබ කැමති මාතෘකාවක් යටතේ රචනාවක් ලියන්න.

i මා ගිය විනෝද චාරිකාවක්

- චාරිකාව යාමට සූදානම් වීම
- ඒ සඳහා අවසර ගැනීම
- දෙමාපියන් දැනුවත් කිරීම
- නරඹන ස්ථාන පිළිබඳ තොරතුරු රැස්කර ගැනීම
- ගමන පිටත් වීම
- නරඹන ලද ස්ථානවල වැදගත්කම දක්වෙන විෂය කරුණු
- එම ස්ථානවලින් ලද අත්දැකීම්

ii කෘෂිකර්මාන්තය නංවමු.

- කෘෂිකර්මාන්තය හැඳින්වීම
- කෘෂිකර්මාන්තයේ අගය
- අපේ රජවරුන් කෘෂිකර්මාන්තය සඳහා ඉටුකළ මෙහෙය
- රටට බත සැපයීමට ගොවීන් ගන්නා උත්සාහය
- කෘෂිකර්මාන්තය කෙරෙහි ඇති ගැටලු
- කෘෂිකර්මාන්තය නැංවීමට යෝජනා

iii අපේ ගම

- ගමේ පිහිටීම සහ වටපිටාව
- ගමේ ඇති විශේෂ ස්ථාන
- ගමේ ඇති විශේෂ වගාවන්
- ගමේ වැසියන්ගේ ප්‍රධාන ජීවන වෘත්තීන්
- ගමේ ඇති අඩු පාඩු හා ඒවා මඟහරවා ගතහැකි ක්‍රම
- ගම කෙරෙහි ඇති ඔබේ ඇල්ම
- ගමේ දියුණුවට ඔබෙන් විය යුතු යුතුකම්

04). පහත සඳහන් විස්තර අතුරෙන් එකක් තෝරාගෙන සුදුසු මාතෘකාවක් යොදා රචනයක් ලියන්න.

i විහඟ ගී නාදය සමඟ උදා හිරු දසතින් කිරණ විහිදුවයි. සේද සළු වැනි වලාකුළු පරිසරය අලංකාර කරයි. ගැමියෝ කඩිසර ව සිය කාර්යයන්හි නිරත වෙති. පසෙක තිල්වන් කෙත් යාය සිප එන මඳ සුළඟ මා වෙළා ගනී. විල් තෙර තනි වූ මම අවට සුන්දරත්වයෙන් වශී වූයෙමි.

ii රිය අනතුරු අද බහුල වී ඇත. මඟී ජනයාගේ මෙන් ම රියැදුරන්ගේ නොසැලකිල්ල මෙයට හේතුවයි. මුදල පසු පස හඹා යන රියැදුරන් මිනිස් ජීවිත ගැන මෙයට වඩා සැලකිලිමත් විය යුතු ය. මඟීන්ගේ ගමන් පහසුවත්, රිය අනතුරු වැළැක්වීමත් සඳහා රියැදුරන් මෙන් ම මඟී ජනයා ද අවබෝධයෙන් හා සහයෝගයෙන් ක්‍රියා කළ යුතු ය.

iii පරිසරය ඉතා අලංකාර ය. පොලිතින් හා ප්ලාස්ටික් භාවිතය මඟින් පරිසරය දූෂණය වේ. මේවා පිළිස්සීමෙන් වාතය ද අපිරිසිදු වේ. පොලිතින් හා ප්ලාස්ටික් වෙනුවට වෙනත් යමක් භාවිත කළ හැකි නම් මේ උවදුර වළක්වා ගත හැකි ය. පොලිතින් හා ප්ලාස්ටික් භාවිතය දුරලීම මඟින් අප පරිසරය අපිරිසිදු වීම වළක්වමු.